# කාය-චිත්ත ගැටලුව පිළිබඳ බෞද්ධ විග්‍රහ ඇසුරෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය, බෝකුන්දර චන්දිම හිමි[1]

## හැඳින්වීම

මිනිසා සිතීමට පටන්ගත් දිනයේ පටන් ගොඩ නැගුණු සංකල්ප දාර්ශනික හා ආගමික මුහුණුවරක් ගනී. භය පදනම් කරගෙන ආගමත් සැකය පදනම් කරගෙන දර්ශනයත් බිහි වූ බව විද්වත් මතය යි. යමක පැවැත්ම පිළිබඳ විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම තුළින් විවිධ දාර්ශනික ගැටලු ඉස්මතු වී ඇත. එබඳු ගැටලුවක් ලෙස කාය-චිත්ත ගැටලුව පෙන්වා දිය හැකි අතර, එසේ නොයෙක් අයුරින් විස්තර විග්‍රහ කොට ඇති උක්ත ප්‍රස්තුතය සම්බන්ධයෙන් ඇති බෞද්ධ මතය පෙළ සාහිත්‍යාගත සූත්‍රානුසාරයෙන් විමර්ශනයක් මෙහි දී සිදු කරනු ලබයි

## පර්යේෂණ අරමුණ

බුදුදහමේ දැක්වෙන කය හා සිත පිළිබඳ කරන ලද විවරණ, මූලාශ්‍රය අධ්‍යයනය කරමින් එහි ඇති කරුණු අනුව ඒවායේ අනන්‍යතා ලක්ෂණ පෙන්වා දීමටත් ඒ අනුව බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් කය හා සිත අතර පවත්නා සම්බන්ධතාව පෙන්වා දීමත් ය.

## පර්යේෂණ ක්‍රමවේදය

පාලි ත්‍රිපිටකය හා තදනුබද්ධ මූලාශ්‍රය උපයෝගී කර ගනිමින් සිත හා කය අතර පවත්නා ස්වභාවයන් හා සම්බන්ධතාවන් පිළිබඳ විමර්ශනය කිරීම උපයුක්ත පර්යේෂණ ක්‍රමවේදය යි.

## පර්යේෂණ ගැටලුව

මෙහි දී පර්යේෂණ ගැටලු ව වශයෙන් යොදා ගන්නා ලද්දේ කය හා සිත පිළිබඳ විවිධ ආගමික දාර්ශනික සම්ප්‍රදායන්හි නොයෙක් අයුරින් කරන ලද විවරණ විග්‍රහයන් ය. එසේ පෙන්වා දී ඇති විග්‍රහයන් කෙතරම් දුරට සත්‍ය ද අසත්‍ය ද යන්න බෞද්ධ විග්‍රහයන්ට අනුව විමර්ශනය කිරීම මෙහි ලා උපයුක්ත පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය

උක්ත මාතෘකාගත සංකල්පය පිළිබඳ ව ඉදිරිපත් වී ඇති වෛදික, බ්‍රාහ්මණික, බටහිර මතවාදයන් පිළිබඳ ව යම්තාක් දුරට අවධානයක් යොමු කරමින් ඒවායේ දක්වා ඇති ස්වභාව ලක්ෂණ පිරික්සා බෞද්ධ විග්‍රහ තුළින් එනම් දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය, එහි ම සොණදණ්ඩ සූත්‍රය හා සංයුත්තනිකායේ සෝතාපත්ති වග්ගයේ තං ජීවං තං සරීරං සූත්‍රය හා එහිම නලකලාප සූත්‍රය, ඉන්ද්‍රක සූත්‍රය හා රේරුකානේ චන්‍ද්‍රවිමල හිමියන් විසින් සම්පාදිත පටිච්චසමුප්පාද විවරණය ආදී ග්‍රන්ථ උපයෝගී කොට ගනිමින් එයට අදාළ කරුණු දිග හැරේ.

---

[1]. බෞද්ධ දර්ශනය (විශේෂවේදී), පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
*chandimabokundara@gmail.com*

**පර්යේෂණ රාමුව**

කය හා සිත පිළිබඳ වෛදික, බ්‍රාහ්මණික, ශාස්වත හා උච්ඡේදවාදීන් විසින් ඉදිරිපත් කර ඇති මතවාදයන් පිළිබඳවත් බුදුදහමේ ඒ සඳහා ඉදිරිපත් කෙරෙන විවරණත් විශේෂයෙන් ම දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය, සෝණදණ්ඩ සූත්‍රය හා සංයුත්තනිකායේ නලකලාප සූත්‍රය, ඉන්‍දක සූත්‍රය ආදී සූත්‍ර උපයෝගී කොටගෙන කය හා සිත පිළිබඳ විවරණයක් ඉදිරිපත් කෙරේ.

**පර්යේෂණ සාකච්ඡාව**

කාය-චිත්ත ගැටලුව පෙරදිග මෙන් ම අපරදිග දාර්ශනික ගුරුකුලයන්හි ද විවිධ ආගමික සන්‍දර්භයන් තුළ ද මතවාද රාශියකට තුඩුදුන් පැතිකඩකි. මෙහි දී කය යන්න හැඳින්වීම සඳහා ශරීරය, භෞතිකත්වය ආදිය භාවිත වන අතර, චිත්ත යන්න හැඳින්වීම සඳහා 'මනො', 'විඤ්ඤාණ' ආදී යම් යම් විශේෂතා මත පදනම් වූ පර්යායන් භාවිත වේ. මේ ගැටලු ව පිළිබඳ පෙරදිග මෙන් ම අපරදිග දාර්ශනිකයෝ ද විවිධ අර්ථකථන ලබා දී ඇත. මාක්ස්වාදීන්ට අනුව ද්‍රව්‍යයන්හි පරිණාමයෙන් මනස හා කය නිර්මාණය වී ඇති බව දක්වයි. විඤ්ඤාණවාදීන්ට අනුව මනස ප්‍රමුඛ කොටගත් දෙයක් ලෙස දක්වයි. දේවවාදී ආගම්වලට අනුව දෙවියන්ගේ නිර්මාණයක් ලෙස දක්වයි. ශාස්වතවාදීන්ට අනුව "**තං ජීවං තං සරීරං**" එයම ජීවය එයම ශරීරය ලෙස දක්වයි. උච්ඡේදවාදීන් ට අනුව "**අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං**" ජීවය එකකි ශරීරය තවත් එකක් ලෙස දක්වයි. භෞතිකවාදීන්ට අනුව ජීවය ම ශරීරය ලෙස දක්වයි. ශරීරයෙන් බැහැර ව සිතක් නො පවති. එසේ පවතී නම් එය පෙන්විය හැකි විය යුතු ය යනුවෙන් දක්වයි. මේ අයුරින් පෙර අපර දෙදිග දාර්ශනික මතවාදයන් තුළ කය හා සිත පිළිබඳ ව විවිධ මත නිර්මාණය වී ඇත. බුදුසමය තුළ ද මේ පිළිබඳ පුළුල් සාකච්ඡාවක් පවතී. එය අන්තවාදයකට නො වැටෙන හේතුප්‍රත්‍ය මත පදනම් වූ දාර්ශනික සාකච්ඡාවකි.

බ්‍රහ්මජාල සූත්‍රයේ දී ඉදිරිපත් වන දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන්හි ද මේ පිළිබඳ සාකච්ඡාවට බඳුන් වේ. එම විග්‍රහය වාදයක් ලෙස පෙන්වා දෙයි. සදාකාලික කයක් පවතී යැයි යමෙක් තීරණය කරන්නේ නම් ඔහු ශාස්වතවාදියෙකි. එසේ නො පවතී යැයි යමෙක් කියන්නේ නම් හෙතෙම උච්ඡේදවාදියෙකි. බෞද්ධ විග්‍රහය මේ අන්ත දෙකෙන් බැහැරව ගොඩ නැගුණකි. **සංයුත්තනිකායේ සෝතාපත්ති වර්ගයේ** එන තං ජීවං තං සරීරං සූත්‍රයට අනුව එය ම ජීවය එයම ශරීරය යැයි පවත්නා දෘෂ්ටියකි. එසේ ම අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං සූත්‍රයට අනුව ජීවය වෙනකකි ශරීරය වෙනකකි යනුවෙන් ගැනීම ද දෘෂ්ටිවාදයකි. මෙම කොටස් දෙකෙන් ම බැහැර ව කරුණු දක්වන බුදුසමය කය හා මනස වෙන වෙන ම පවතින නමුත් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ කොටස් දෙකක් ලෙස දක්වයි. ඒ සඳහා බුදුසමයේ මූලික ඉගැන්වීම් සාක්ෂි සපයයි. බුදුසමයේ එන නාමරූප විග්‍රහයට අනුව සත්ත්වයා ස්කන්ධ පහකින් නිර්මාණය වී ඇත. රූප, වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ වශයෙන් බෙදා දක්වන අතර, එය කාය-චිත්ත වශයෙන් නාම-රූප ලෙස වර්ග කෙරේ. මේ දෙවර්ගය ම සඞ්ඛත ගණයට අයත් වන නිසා ඇතිවීම පැවතීම නැතිවීම යන ස්වභාවයන්ට පත් වේ. එබැවින් මෙය වෙනස් වෙමින් පවතින ස්වභාවයක් ලෙස බුදුසමය අවධාරණය කරයි. **නලකලාප සූත්‍ර** විග්‍රහයට අනුව පෙන්වා දෙනුයේ "**ද්වෙ නලකලාපියො අඤ්ඤමඤ්ඤං නිස්සාය තිට්ඨෙය්‍යුං**" වශයෙනි. එනම් සිත හා කය එකිනෙකට සම්බන්ධ කොට පවත්නා

බටම්ටි දෙකක් වැනි ය. එකක් ගත්විට අනික නො රඳනා සේ මනසක් නොමැති ව කයක් ද කයක් නොමැති ව මනසක් ද ලෞකික ලෝකයෙහි නො පවතී. එබැවින් කය හා මනස අන්‍යෝන්‍ය සම්බන්ධතාවකින් යුතු ධර්මතාවන් දෙකකි. **සොණදණ්ඩ සූත්‍ර** විග්‍රහයට අනුව සත්ත්වයාගේ උපත සඳහා කාරණාවන් තුනක් එක් විය යුතු ය. එනම්,

1. මවගේ ඍතු වීම
2. මවුපිය දෙදෙනාගේ එක්වීම
3. ගන්ධබ්බයාගේ පැමිණීම

යනුවෙනි. මෙයින් මුල් කාරණා දෙකම කය පදනම් වූවකි. තෙවැන්න මනස පදනම් කරගත්තකි. එබැවින් කය යනු නිර්මාණය වී වෙනස් වෙමින් පවතින්නකි. මනස යනු වෙනස් වෙමින් ගමන් කරන්නකි. ඒ අනුව ද කය හා සිත අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූවකි. එහෙත් වෙන වෙන ම වූ අනන්‍යතාවකින් යුක්ත වූවකි. තව ද **පටිච්චසමුප්පාද** විග්‍රහයට අනුව **"අස්මිං සති ඉදං හොති, ඉමස්ස උප්පාදා ඉදං නිරුජ්ඣති"** මෙය ඇති කල්හි මෙය පවතී. එනම්, මනස ඇති කල්හි කය පවතී, කය ඇති කල්හි මනස පවතී. එබැවින් ද කය මනස අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූවකි. මේ අනුව බැලීමේ දී පෙනී යන බුදුදහමේ ස්ථාවරය නම් සිත හා කය ආරම්භයේ පටන් ම අන්‍යෝන්‍ය වශයෙන් සබඳතා පවත්වයි, වෙන ම නිර්මාණය වේ. එබැවින් මෙහි පවතිනුයේ අවියෝජනීය සබඳතාවකි. මේ සියලු කරුණු විමසීමේ දී දාර්ශනික ක්ෂේත්‍රය තුළ පුළුල් ව සාකච්ඡා වන දාර්ශනික ගැටලුවක් වන කාය-චිත්ත ගැටලුව බුදුසමයේ දී අන්තවාදයකට නො වැටී හේතුප්‍රත්‍ය සමවායෙන් පවත්නා වූ තත්ත්වයක් ලෙස අවධාරණය කරමින් දාර්ශනික පිළිතුරක් සපයයි.

**පර්යේෂණ නිගමනය**

ලොව පවත්නා යම් ආගමික දාර්ශනික මෙන් ම අනේකවිධ ප්‍රස්තුත උදෙසා අර්ථවිවරණ ඉදිරිපත් කිරීමට ඕනෑ ම අයෙකුට ස්වතන්ත්‍ර අයිතියක් ඇත. නමුත් එසේ විවරණය කරන ලද අර්ථවිග්‍රහයන් විශ්ලේෂණයන් ම යථා ස්වභාවය හෙවත් පරමාර්ථ සත්‍ය කෙරේ යහපත් ලෙස කෙතරම් දුරට බලපාන්නේ ද යන්න වැදගත් කරුණකි. මන්දයත් අසත්‍ය තුළින් හෝ වැරදි විග්‍රහ තුළින් පුද්ගලයා අන්ධ විශ්වාසයටත් ඒ මඟින් අවිද්‍යාවටත් යොමු වන බැවින් ය. එබැවින් සියල්ල පිළිබඳ සත්‍ය විවරණ තුළින් ආත්මීය සාධනය මෙන් ම ජීවිත අවබෝධය ද ලැබීමට මඟ පාදන්නේ ය.

**ප්‍රමුඛ පද:** කාය, චිත්ත, බුදුසමය, ශාස්වත, උච්ඡේද, මනස

මූලාශ්‍රය

- **දීඝනිකාය.** සීලක්ඛන්ධවග්ග. බ්‍රහ්මජාල සූත්‍රය. (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්මුද්‍රණ). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **දීඝනිකාය 1.** සීලක්ඛන්ධවග්ග. සොණදණ්ඩ සූත්‍රය. (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්මුද්‍රණ). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සංයුත්තනිකාය 2.** මහාවග්ග. නලකලාප සූත්‍රය. (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්මුද්‍රණ). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- චන්දවිමල හිමි, රේරුකානේ (2014). **පටිච්චසමුප්පාද විවරණය.** විසිවන මුද්‍රණය. අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.